# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1998 අංක 44 දරන ජාතික උරුමය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 අගෝස්තු මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 අගෝස්තු මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 5.75 | තැපැල් ගාස්තුව : රු. 2.50

## 1998 අංක 44 දරන ජාතික උරුමය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1998 අගෝස්තු මස 14 වන දින]

එල්. ඩී.—ඕ. 3/93.

**ජාතික උරුමය සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ජාතික උරුමය සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංවිධානයක් එකී සංවිධානයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංවිධානයට සම්බන්ධ සියලුම පරමාර්ථ සහ කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංවිධානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංවිධානය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් ද ඒ සංවිධානය සංස්ථාගත කිරීමට ඉල්ලුම්කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 44 දරන ජාතික උරුමය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික උරුමය සංවිධානයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව "ජාතික උරුමය සංවිධානය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු ය. තවද ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ජාතික උරුමය සංවිධානය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

## 1998 අංක 44 දරන ජාතික උරුමය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1998 අගෝස්තු මස 14 වන දින]

එල්. ඩී.—ඕ. 3/93.

**ජාතික උරුමය සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ජාතික උරුමය සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංවිධානයක් එකී සංවිධානයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංවිධානයට සම්බන්ධ සියලුම පරමාර්ථ සහ කරුණු එලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංවිධානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංවිධානය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් ද ඒ සංවිධානය සංස්ථාගත කිරීමට ඉල්ලුම්කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 44 දරන ජාතික උරුමය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික උරුමය සංවිධානයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව "ජාතික උරුමය සංවිධානය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු ය. තවද ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ජාතික උරුමය සංවිධානය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව, ස්වාධිපත්‍යය හා ඒකීයභාවය ආරක්ෂා කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ වෙසෙන විවිධ ප්‍රජාවන් අතර සමගිය ප්‍රවර්ධනය කිරීම, නංවාලීම සහ පවත්වාගෙන යාම ;

(ඇ) විවිධ ජාතික, ආගමික සහ ජනවාර්ගික එකමුතුකම ප්‍රවර්ධනය කිරීමට සහ සමාජ අශක්නුතා මූලෝත්පාටනය කිරීමට ආධාර කිරීම ;

(ඈ) ත්‍රස්තවාදී ක්‍රියාවලින් විපතට පත්වූවන්ට ආධාර කිරීම ;

(ඉ) බෞද්ධයන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහ අන්‍ය භක්තිකයන් සමග සමගිය සහ සහජීවනය ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) ජාතියේ අනන්‍යතාව ආරක්ෂා කිරීම සඳහා උචිත පියවර ගැනීම ;

(උ) ජාතික, සංස්කෘතික, සමාජයීය හා පාරිසරික උරුමය ආරක්ෂා කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙ යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබාගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වුවද සියලු ක්‍රියා කිරීමේ හා ඉටුකිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු සභාපති, උප සභාපතිවරු, ලේකම්, උප ලේකම්වරු, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත්කරගනු ලබන හය දෙනකුට නොඅඩු වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකාර මණ්ඩලයක් විසින් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව, කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංවිධානයේ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

6. (1) සංස්ථාව විසින්, කලින් කල, යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) නිල දරන්නන් තෝරා පත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) කළමනාකාර මණ්ඩලයේ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, එහි ගණපූරණය සහ එහිදී කටයුතු කර ගෙන යාම ;

(ඊ) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ;

(උ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කරගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලපැවැත් වූ සංවිධානයේ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට,

සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් එවැනිම රැස්වීමක දී සහ එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය :—

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවේ අරමුදල පහත දැක්වෙන මුදල් වලින් සමන්විත විය යුතුය

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංවිධානයේ බැරට තිබී මෙදින සිට සංස්ථාවට බැර කරනු ලැබිය යුතු සියලු මුදල් ; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සංස්ථාවට උපචිත වන සියලු මුදල්.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංවිධානය විසින් ගෙවිය යුතු සහ සංවිධානයට අයවිය යුතු ණය.

8. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංවිධානයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් පිහිටුවනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට සංවිධානයට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. සංස්ථාවේ සභාපති හා ලේකම් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව, කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතුය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

10. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් ආකාරයකින්, සංස්ථාව වෙත සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් තත් කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත්ව භාර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය සහ හැකියාව ඇත්තේ ය. තවද එවැනි සියලු දේපළ මේ පනතේ කාර්යය සඳහා සහ තත් කාලයේ බලපවත්නා සංස්ථාවේ රීති වලට යටත්ව ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

11. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙතින් ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන්ගේ හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.